**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තුරුලිය සෙවන නිවාඩු නිකේතනයේ තිබුණු සෝෆාව සමාලෝචිත වර්ෂයේදී රු.45,000 ක් වියදම් කර අලුත්වැඩියා කර තිබුණු නමුත් එය සභාවේ වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගන්නා බව. | සභාවට අයත් වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සූර්ය බල ශක්ති පද්ධතියෙන් සමාලෝචිත වර්ෂයේදී රු.583,860 ක ආදායමක් ලැබී තිබුණු නමුත් එය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ රු.492,990 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලිය රු.1,417,871 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ එය රු.1,206,602 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු රු.1,395,212 ක වෙනත් ස්ථාවර තැන්පත් පොලිය ද ලැබිය යුතු ආදායමක් ලෙස දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩා ලේඛනය අනුව වීදි පහන් තොගයේ වටිනාකම රු.154,315 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ එය රු.132,115 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් විස්තීරණ ආදායම් ප්‍රකාශනය අනුව රු.7,784,039 ක් වුවත් සටහන් අංක 05 අනුව එය රු.7,247,418 ක් වූයෙන් රු.536,621 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | වත්කම් සහ වගකීම් ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.8,600,360 ක් වුවත් උපලේඛනය අනුව එය රු.6,767,684 ක් වීම නිසා රු.1,832,676 ක වෙනසක් විය. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | නල ළිං අමතර කොටස් තොගය | 58,034 | තොග ලේඛන පවත්වාගෙන නොයාම | පිළිගන්නා බව. | තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු මුද්දර ගාස්තු | 22,436,908 | ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන නොයාම | -එම- | -එම- |
| (ඇ) | පාරවල් හා බෝක්කු | 10,277,416 | විස්තරාත්මක උප ලේඛන | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.3,079,423 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.17,445,266 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| කර්මාන්ත ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ මාසවල රු.10,000,000 කට වැඩි ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණු නමුත් එම මුදල් සභාවට ආදායමක් ලැබෙන ආයෝජන මාර්ගයක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | අතිරික්ත මුදල් ආයෝජනය කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,016,000 | 2,429,497 | 2,472,847 | 826,770 | 3,437,000 | 2,436,695 | 1,891,095 | 870,120 |
| (ii) | කුලී | 14,594,690 | 3,675,830 | 3,640,971 | 1,431,836 | 10,428,000 | 4,848,201 | 5,124,094 | 1,396,977 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,450,000 | 1,503,966 | 1,445,767 | 1,176,263 | 1,565,000 | 1,128,544 | 1,440,705 | 1,118,064 |
| (iv) | වෙනත් ආදායම් | 38,240,400 | 34,812,231 | 35,308,195 | 44,417,423 | 30,765,620 | 26,517,423 | 35,679,398 | 44,913,387 |
| | | 57,301,090 | 42,421,524 | 42,867,780 | 47,852,292 | 46,195,620 | 34,930,863 | 44,135,292 | 48,298,548 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශයේ තිබෙන දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන ගැසට් කර වරිපනම් බදු පැනවීම සඳහා අවශ්‍ය කටයුතු සමාලෝචිත වර්ෂයේදී ද සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | වරිපනම් පැනවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| (i) | ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර 09 ක් හා බදු දියහැකි වත්කම් 08 ක් 2023 වර්ෂය තුළදී නිෂ්කාර්යව පැවතීම නිසා ඒ වෙනුවෙන් ලබාගත හැකිව තිබුණු අයවිය යුතු ආදායම් අහිමි වී තිබුණි. | -එම- | වත්කම් ඵලදායී කටයුත්තක යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයට පෙර සිට පැවත එන රු.1,227,589 ක හිඟ කුලී අයකරගෙන නොතිබුණි. | -එම- | හිඟ කුලී අයකරගත යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාළ කඩ කුලී බිල් කිරීම රු.522,100 ක් වූ අතර එයින් සියයට 22 ක් වූ රු.113,500 ක් අයකරගෙන නොතිබුණි. | -එම- | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | සමාලෝචිත වර්ෂයට පෙර සිට පැවත එන හිඟ කඩ කුලී රු.44,000 ක් සහ හිඟ වාහන කුලී රු.31,190 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | සභා බල ප්‍රදේශයේ තිබෙන සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 05 ක ආදායම අනුව අයවිය යුතු සියයට 01 ක බලපත්‍ර ගාස්තුව අයකරගෙන නොතිබුණි. | -එම- | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් හඳුනාගෙන බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.8,600,360 ක් හා මුද්දර ගාස්තු රු.22,436,908 ක් අයකරගෙන නොතිබුණි. | -එම- | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණයේදී මෙන්ම 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී පෙන්වා දෙන ලද සභාවේ වත්කම් ඌනතාවයන් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වත්කම් ඌනතාවයන් සම්බන්ධයෙන් පරීක්ෂා කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී බල ප්‍රදේශයේ සිදුවී තිබුණු බවට පැමිණිලි ලැබී තිබුණු අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, ඒ පිළිබඳ විස්තර සඳහන් ලේඛනයක් ද සභාව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ආදායම් උත්පාදනය වෙනුවෙන් ලබාගත් බ්ලොක් ගල් නිෂ්පාදන යන්ත්‍රය, වාහන සේවා මධ්‍යස්ථානය සහ කවරක්කුලම කඩ සංකීර්ණයේ තිබෙන කඩ කාමර 08 ක් එම අදාළ අරමුණු සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නොමැති බව. | වත්කම් උපයෝජනය කර ආදායම් උත්පාදනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1. වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී උසාවි දඩ සහ මුද්දර ගාස්තු ලෙස රු.21,569,395 ක් ලැබී තිබුණු නමුත් 1987 අංක 18 දරන ප්‍රාදේශීය සභා පනතේ III වන කොටසේ 2 වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශයේ අබලන් මාර්ග නඩත්තු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මෙම මුදල් යොදවා ගෙන බල ප්‍රදේශයේ අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සිදුකළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයෙන් එකතු කරන නොදිරන කසළ බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම නිසා සභා පරිශ්‍රයේ පරිසරයට හානි වන ලෙස කසළ ගිනි තැබීම සහ එක්රැස් කිරීම සිදුකර තිබුණි. | අදහස් දක්වා නොමැති බව. | කසළ විධිමත්ව බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |